# ඇන්තූරියම් මලේ කතාව



එස්. එම්. ජී. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

**පොතේ නම** - ඇන්තූරියම් මලේ කතාව

**කතෘ** - එස්. එම්. ජී. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

**කතාව සහ චිත්‍ර** - එස්. එම්. ජී. දෙහන්සා මෙතුම්ලී සුදුහුම්පොල

**කතෘගේ වෙනත් කෘති**

- අපූරු තෑග්ග

**කෘතිය පළ කරන දිනය -** 2023.11.15 දින

**ISBN NO –** ISBN 978-624-206-951-7

**පිදුම**

මාගේ ගුණ නැණ වඩවාලමින් ආදරයෙන් මා හට සිප්සතර හැදෑරූ ආදරණීය ගුරු මෑණිවරුන්ට හා ගුරු පියවරුන්ටත් ගරුවිදුහල්පතිතුමියටත් මා ආදරයෙන් ඇති දැඩි කරමින් රැක බලා ගන්නා ආදරණීය අම්මාටත් අප්පච්චිටත් පුංචි නංගිටත් මේ පොත කියවා රසවිඳින සියලුම පාඨකයන්ටත් මෙම පොත ආදරයෙන් පුදමි .

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග් රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ් යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11. 01

ඔන්න, එකෝමත් එක කාලයක, පුංචි නගරයක, බොහෝම දුප්පත් පවුලක පුංචි ළමයෙක් ජීවත් වුණා. ඒ පුංචි ළමයාගේ නම තමයි ජෝන්. එයාගේ තාත්තා නැතිවුණේ ජෝන් ට අවුරුදු දෙකේ දී විතර. ඉතිං එදා ඉඳන්ම එයා ජීවත්වුණේ,ඔහුගේ තරුණ මව සහ මහලු සීයා සමඟ යි.  ඔවුන් ජීවත්වුණේ , ජෝන් ගේ අම්මා කුලී වැඩ කර උපයාගත් සුළු මුදලින්. නමුත් එය මේ පුංචි පවුලට එක වේලක් කන්නවත් සෑහුණේ නැහැ.



මේ පුංචි පවුල ජීවත් වුණේ , නගරයට මඳක් ඈතින් පිහිටි ඉතාමත් සුන්දර දොළ පහරක් අසළ තිබුණු පුංචි නිවසකයි. මේ ගෙදර තිබුණේ එක ම එක කාමරයකුයි ,පුංචි මුළුතැන්ගෙයකුයි විතරමයි . ඉතිං ඔයාලට තේරෙනවා නේද මේක කොතරම් පුංචි ගෙදරක් ද කියලා .



පුංචි වුණාට ජෝන් හරිම බුද්ධිමත් ළමයෙක් . ඒත් එයාගේ අම්මා ට ජෝන් ව ඉස්කෝලේ යවන්න තරම්වත් වත්කමක් තිබුණේ නැහැ. ගණං හදන්න බැරි වුණාට පුංචි ජෝන් ට අකුරු ලියන්න වගේ ම කියවන්නත් එයාගේ අම්මයි සීයයි එයාලට පුළුවන් විදිහට කියා දුන්නා.

මෙයාලා දුප්පත් වුණාට සතුටින් ජීවත් වුණා . ඒ වෙන කවුරුත් නිසා නොවෙයි , ඒ අපේ පුංචි ජෝන් නිසා .

ඒත් එක්තරා අඳුරු කාලයක ජෝන් ගේ සීයා දරුණු විදිහට අසනීප වුණා . එක දවසක්, රාත්‍රී කාලයක ජෝන් ගේ අම්මා ට ශබ්දයක් ඇහිලා ඇහැරුණා. ඒ එයාගේ තාත්තා (ඒ කියන්නේ ජෝන් ගේ සීයා ) එයාගේ දුවට කතා කරන ශබ්දය යි. ඉතිං ජෝන් ගේ අම්මා ඉක්මනට සීයා ළගට දුවගෙන ගියා .

"මගේ දුවේ, මේ අල්මාරියේ තියෙනවා පුංචි රිටක් සහ කබායක්. ඒවා මා ළඟට අරගෙන එන්න."

සීයා ගෙදර තිබුණු එකම අල්මාරිය පෙන්නලා කිව්වා.

"හොඳයි තාත්තේ"

කියලා කියපු ජෝන් ගේ අම්මා අල්මාරිය ළඟට ගියා. එයා අල්මාරිය විවෘත කරලා රිට සහ කබාය එළියට අරගත්තා.





ජෝන් ගේ අම්මා ඒවා සීයා ළඟට අරගෙන ගියා.

"ස්තුතියි දුවේ. දැන් ඔයා ජෝන් ව මෙතනට එක්කරගෙන එන්න."

ජෝන් ගේ අම්මා ජෝන් ව නැගිටවලා සීයා ළඟට එක්කරගෙන ආවා.

"හොඳයි දුවේ, දැන් ඔයා කාමරයෙන් එළියට යන්නකෝ."

සීයා එහෙම කිව්වා.

ඉතිං සීයා අර රිට සහ කබාය ජෝන් ට පෙන්නුවා.

"පුතේ, මේ තියෙන්නේ මගේ මී මුත්තාගෙන් අපේ පරම්පරාවට ලැබුණු මායා බඩු ටිකක්. ඉතිං ඔයා මේවා භාවිත කරන්න දැන ගන්න ඕන . පුතේ, මේ රිටෙන් ඔයාට එක වරමක් ඉල්ලන්න පුලුවන් . ඒ වගේ ම මේ කබායෙන් ඔයාට නොපෙනී ඉන්න පුලුවන් . මේවා ඔයාලට කවදාහරි දවසක වාසනාව ගෙනදෙයි."

කියලා ඉවරවෙනවත් එක්කම සීයා එයාගේ අවසන් හුස්ම හෙලුවා .

බුද්ධිමත් පුංචි ජෝන් තේරුම් ගත්තා ඒවා භාවිත කරන්න එයා තවම පුංචි වැඩියි කියලා . ඉතිං එයා පුංචි රිට සහ කබාය අල්මාරිය ඇතුළේ හැංගුවා .

කාලය පුදුමාකාර වේගයකින් ඉගිළී ගියා . කොහොම වුණත් දැන් ජෝන් කඩවසම් , ශක්තිමත් තරුණයෙක් .එයා ගස් කපා ඒවා පොළට අරගෙන ගිහින් විකුණලා ලැබෙන මුදලින් තමයි ජීවත්වුණේ.එක දවසක් ජෝන් එයා කපපු ලී ටික කරත්තයට පටවලා පොළට අරගෙන ගිහින් විකිණුවා. ඉතිං එයාට ලැබුණු මුදල් අරගෙන හරිම සතුටින් පරිසරයේ සුන්දර නරඹමින් ම ආවේ එදා එයාට හොඳ මුදලකට ලී ටික විකුණගන්න පුලුවන් වූ නිසයි .



එයා එහෙම එනකොට දැක්කා නගරයේ තාප්පයක අලවා තිබූ දැන්වීමක්. එයා ඒක කියෙව්වා. ඒ එයාලගේ රටේ රජතුමා රටවැසියන් ට එවපු දැන්වීමක් .

ඒ පණිවිඩයේ සඳහන් වුණේ

"මේ ලෝකයේ එක පෙත්තක් තිබෙන මලක් සොයාගෙන එන ඕනෑම කෙනෙකුට තමන්ගේ රටෙන් භාගයක් ලබාදෙන බවත්, තම දූ කුමරිය ව විවාහ කර දෙන බවත් ය ."

මේ රටේ රජතුමා ඉතාමත් බලසම්පන්න, මායාකාර රජ කෙනෙක් . ඉතිං එයා හිතන් හිටියේ තමා තරම් බලසම්පන්න මායාකාරයෙක් මේ ලෝකයේ තවත් නැහැ කියලයි.

ඉතිං ජෝන් මේ අභියෝගය ගැන තදින් කල්පනා කළා. යන ගමන් එයා කොතරම් තදින් මේ ගැන කල්පනා කළා ද කිවුවොත් තව ටිකෙන් එයා ඉදිරියෙන් එන කරත්තයක හැප්පෙනවා . ඉතිං එයා ගෙදර ගිහින් තවත් කල්පනා කළා . ජෝන් ට හිතුණේ

"මම මේ අභියෝගය භාර ගත්තොත් මට පුලුවන් රටින් භාගයක් ලබා ගෙන දූ කුමරිය ව විවාහ කරගන්න." කියලා .

ඉතිං එයා ඊළඟ දවසේ උදේ පාන්දරින් ම නැඟිටලා රජ මාලිගය ට ගියා . ඒ යනකොට එයා දැක්කා , රාජකීය මල් වත්තේ මැද කොටසේ ඉතාමත් අලංකාර මල් පාත්තියක් . ඒ මල් පාත්තියේ තිබුණේ එකම වර්ගයේ මල් වුණාට ඒවා පාට පාටයි . ඒ මල් හරිම ලස්සනයි . ඒ විතරක් නෙවෙයි . ඒ මල්වලට පෙති පහක් තිබුණා . ඒ මල් මොනවාද  කියලා රජුගෙන් අසා දැනගන්න ඕන කියලා ජෝන් ට හිතුණා.



ජෝන් රජවාසල ඇතුළට ගියා.

"නුඹට මොනවාද උවමනා? "

රජතුමා ජෝන්ගෙන් ඇසුවා.

"අවසරයි මහ රජතුමනි, මා පැමිණියේ ඔබතුමාගේ අභියෝගය භාරගැනීම සඳහා මා සූදානම් බව ඔබවහන්සේට පැවසීමටයි."

රජතුමා මහ හයියෙන් හිනාවුණා.

"හහ් හහ් හා....හාහ්..හහ් හහ් හා.... ඔබ එය භාරගැනීමට සූදානම් ද ඉලංදාරියා ? හහ් .. හහ් හහ් හහ් හා...... හොඳයි එහෙනම්, මා එම මල සොයා ගැනීමට නුඹට දින තුනක කාලයක් ලබා දෙනවා. නමුත්

එම දින තුන ඇතුළත නුඹට එම මල සොයා ගැනීමට නොහැකි වුවහොත් මා නුඹ ව සිරගත කරන බව තරයේ සිහි තබා ගනු".

රජතුමා පැවසුවා.

"හොඳමයි රජතුමනි, නමුත් මට ඔබවහන්සේගෙන් ඇසීමට තවත් එක් ප්‍රශ්නයක් ඉතිරිව තිබෙනවා".

ජෝන් යටහත් පහත්ව රජතුමා ගෙන් එහෙම ඇහුවා.

"ඒ කුමක්ද තරුණයා?"

රජතුමා ඇසුවා.

"රජතුමනි, ඔබවහන්සේගේ රාජකීය මල් උයන මැද පිහිටා තිබෙන  මල් පාත්තියේ ඇති මල් වර්ගය කුමක්ද?"

ජෝන් එයාගේ ප්‍රශ්නය ඉදිරිපත් කළා.

"හා හඟ් හා....... ඒ මල් වලට කියන්නේ ඇන්තූරියම් කියලා. මම ඒවා මැව්වේ මගේ මායා බලයෙනුයි. මගේ උද්‍යානයේ ඇරෙන්න මේ ලෝකයේ වෙන කිසිදු තැනක ඒ මල් නෑ."

රජතුමා හරිම ආඩම්බරයෙන් කිව්වා.

"බොහෝම ස්තූතියි රජතුමනි. එසේනම්, මම ගිහින් එන්නම්."

ජෝන් රජුට කිව්වා.

"හොඳයි, ගිහින් එන්න."

රජතුමා ජොන් ට සමුදුන්නා.

ජෝන් ගෙදර යන්න පිටත්වුණා. එයා ගෙදර ගියා. පාර දෙපැත්තේ වෙනදා දකින්න තියෙන සුන්දර බව එදා ජෝන් දැක්කෙ නෑ. ජෝන් ගෙ කල්පනාව සිත කලබල වෙලා. එයා මුලු දවසම කල්පනා කළා.



දෙවෙනි දවස පුරා ම එයා මල හොය හොයා රට වටේට ඇවිද්දා . තුන්වැනි දවසත් උදා වුණා . එයා මුළු උදේ වරුවේ ම කල්පනා කළා . අන්තිමේ දී එයාට මතක් වුණා , එයා පුංචි කාලයේ දී  එයාට දුන්නු මායා රිට සහ කබාය . එයාට හොඳ අදහසක් පහලවුණා .

ජෝන් එදා රෑ එයාගේ සීයා එයාට දුන්නු මායා කබාය ඇඳගෙන අර රජතුමා ගේ රාජකීය උද් යානය ට ආවා . එය මුරකරන්න හිටිය සෙබළුන් හොඳටම නිදි . ඉතිං ජෝන් උද්‍යානය මැද තිබුණු මල් පාත්තිය ළඟට ආවා . එයා ඒකෙන් මලක් කඩා ගත්තා . ඊටපස්සේ එයා පුලුවන් තරම් ඉක්මනට ගෙදර ගියා .

ඉතිං , එයා එයාගේ මායා රිට අරගෙන මෙහෙම කිවුවා .

"මායා රිට , මායා රිට , ඔබ දැන් මේ පෙති පහක් තිබෙන ඇන්තූරියම් මල එක පෙත්තක් තිබෙන මලක් බවට හැරවිය යුතුයි . "



එහෙම කියනවාත් සමඟම අර පෙති පහේ ඇන්තූරියම් මල එක පෙත්තක් තිබෙන මලක් ලෙසට හැරවුණා.

ඔන්න ඉතිං ඊළඟ දවසත් උදා වුණා . උදේ පාන්දරින් ම ජෝන් ව රජවාසලට කැඳවූවා . ජෝන් මලත් රැගෙන රජවාසලට ගියා .

"හහ් හහ් හා...කොහොමද තරුණයා? නුඹ එකපෙත්තක් තිබෙන මලක් රැගෙන ආවා ද ? "

රජු ඇහුවා .


" එහෙමයි රජතුමනි , මේ තියෙන්නේ ඒ මල "

ජෝන් රජුට ඒ මල පෙන්නුවා. රජතුමාගේ ඇස් උඩගියා.

"ඔහෝ ! .......... මට අදහාගන්නත් බෑ ! ..............කියන්න තරුණයා නුඹ කෙසේද මේ මල සොයාගත්තේ ? "

රජු ඇසුවා . ජෝන් සම්පූර්ණ කතාව රජතුමා ට කීවා .





"අතිවිශිෂ්ටයි! තරුණයා අතිවිශිෂ්ටයි! මා ඔබට මාගේ රටෙන් භාගයක් පමණක් නොවෙයි , මගෙන් පසුව මේ මුලු රට ම ඔබ ට පාලනය කරන්න පුලුවන්. එපමණක් නෙවෙයි , නුඹ ඉතාමත් බුද්ධිමත් තරුණයෙක් . ඒ නිසා මම මගේ දියණියව ඔබ ට විවාහ කර දෙනවා . "

රජු හරිම සතුටින් කිවුවා .



ඔන්න ඊටපස්සේ , ජෝන් ගෙයි එයාගේ අම්මාගෙයි දුප්පත් ජීවිතය එතැනින් ඉවරවුණා .



ඉතිං ජෝන් රජකුමරිය ව විවාහ කරගෙන අම්මාත් එක්ක සතුටින් කල් ගෙවුවා . ආ , ඒ විතරක් නෙවෙයි එදායින් පස්සේ පිපුණු හැම ඇන්තූරියම් මලකට ම තිබුණේ එක පෙත්තයි .



අවවාදය

*" උත්සාහවන්තව , නිර්භීතව , බුද්ධිමත්ව , ගැටලු වලට මුහුණ දුන්හොත් අපට ජීවිතය ජය ගත හැකිය."*

**නි.මි**

**පසුවදන**



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.

ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට අ◌ාලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා යි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01